# රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය (G.O.B.A.)
# ''ලේකම් හා ගණකාධිකාරී''තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

1971 අංක 27 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිත රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමයේ ප්‍රධාන පරිපාලන නිලධාරි වන ''ලේකම් හා ගණකාධිකාරී'' තනතුර උක්ත පනතේ 11 වගන්තිය අනුව රාජ්‍ය නිලධාරියකු විසින් දැරිය යුතුය. දැනට පුරප්පාඩු වී පවතින උක්ත තනතුර සඳහා සම්මත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පහත විස්තර දැක්වෙන සුදුසුකම් සහිත රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(කරුණාකර රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් නොවන පෞද්ගලික අංශයේ සේවයේ නියුතු පුද්ගලයන් අයදුම් කිරීමෙන් වළකින්න.)

1. **සුදුසුකම්**

   1. 1 ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ හෝ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ නිලධාරියෙකු වීම හෝ, ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරියෙකු වීම

   හෝ,

   1.2 කළමණාකරණ සේවා නිලධාරි සේවයේ අධි පන්තියේ නිලධාරියෙකු වීම හෝ කළමණාකරණ සේවා නිලධාරි සේවයේ I පන්තියේ නිලධාරියෙකු වීම හා වසර 05ක පළපුරුද්ද සහිත ව්‍යාපාර කළමනාකරණ/ වානිජ්‍ය විද්‍යා උපාධි හෝ සමාන සුදුසුකම් සහිත වීම.

2. රාජ්‍ය සේවා හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 142 සමඟ කියවිය යුතු 143 වන රීතිය අනුව හා/ හෝ (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි) අයදුම්කරු ද්වීතියන පදනම යටතේ සංගමයේ සේවයට වර්ෂ 2ක කාලයක් සඳහා මුදා හැරිය හැකි බවට ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයක් ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර තිබිය යුතුය. (ඔබගේ අවධානය රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2020 යොමු කරවමි). එහි සඳහන් පරිදි සංගමයේ සේවය කරන කාලය සඳහා අයදුම්කරුගේ ස්ථිර තනතුරට හිමි වැටුපෙන් 25% කට සමාන වන මුදලක් සංගමයෙන් අයදුම්කරුගේ විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂා කිරීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලබන බව සහතික කරන අතර නියමිත % අනුව අයදුම්කරුගේ වැටුපෙන් වැන්දඹු අනත්දරු දායක අරමුදල් අය කර ප්‍රේෂණය කිරීමට ක්‍රියා කරන බව ද සහතික කරමි) ඊට අතිරේකව රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 143 අනුව පරිශිෂ්ට 11 සම්පූර්ණ කර ඉදිරිපත් කර තිබිය යුතුය.

3. **තනතුරට හිමි ප්‍රතිලාභ :**

   3.1 රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ දී ලබාගත් සම්පූර්ණ වැටුප නොඅඩුව (සංගමයේ සේවා කාලය තුළ යෙදෙන වැටුප් වර්ධක ලබා ගැනීම සඳහා සකස්කර ඉදිරිපත් කරනු ලබන කාර්ය සාධන ඇගයීම් වාර්තාවට පත්වීම් බලධාරියාගේ/ අවසන් වරට සේවය කළ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් පසුව ගෙවීම් කරනු ලැබේ)

   3.2 ප්‍රවාහන දීමනා හැර තනතුරට හිමි දීමනා

   3.3 තනතුරට නියමිත වැටුප් ක්‍රමයේ උපයාගෙන ඇති/පිහිටුවා ඇති මූලික වැටුපෙන් 50% අතිරේක දීමනාවක්.

   3.4 රාජ්‍ය සේවයේ හිමි නිවාඩු වලින් ලබානොගත් නිවාඩු සඳහා ඊළඟ වර්ෂය ආරම්භයේදී දීමනා

   3.5 මහා සභාවේ එකඟතාවය මත එක් ලිත් මසක මූලික වැටුපට සමාන ප්‍රසාද දීමනා (වෙනස් විය හැක.)

4. **පොදු කොන්දේසි:**

   4.1 කොළඹ නගරයේ සිට කිලෝමීටර 35ක් තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ඇත.

   4.2 අයදුම්පත් කැඳවන 2022 මාර්තු මස 25 දිනට වයස අවු. 50 නොවැඩි වීම.

   4.3 රාජ්‍ය සේවයේ අවු. 15කට නොඅඩු සේවා කාලයක්

   4.4 ගිණුම් කටයුතු පිළිබඳ වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

   4.5 පරිගණක සාක්ෂරතාවය හා Internet හා E - mail භාවිතා කිරීමේ හැකියාව

   4.6 සිංහල භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව

5. **විශේෂ:**

   ඔබගේ පහසු පරිහරණය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2020, සංගමයේ වෙබ් අඩවියේ භාගත කිරීම් යටතේ ඇතුලත් කර ඇත.

   **2022 අප්‍රේල් මස 26 වැනි අඟහරුවාදා දින මධ්‍යහ්න 12.00ට** පෙර ලැබෙන සේ ඔබගේ ජීව දත්ත හා සහතික ඇතුළත්ව සකස් කරගත් ඉල්ලුම් පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානි මගින් (ඉහත 2 වන ඡේදයේ සඳහන් සහතික හා පරිශිෂ්ඨය සමඟ) පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය.

එන්. එම්. විජේරත්න,
සභාපති.

2022 මාර්තු මස 25 වැනි දින,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය,
අංක 65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.
දුරකථන අංකය :-011- 2334598, 2473633
වෙබ් අංකය:-WWW. goba. lk